**ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1930 අංක 10 දරන රබර් පර්යේෂණ ආඥා පනතේ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින්  සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස  අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01හි 42 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අයිතමයන් ඉදිරිපත් කිරීම එක් කාලපරිච්ඡේදයක සිට ඊළඟ කාලපරිච්ඡේදයට නොවෙනස්ව තබාගත යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කර තිබුණු හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද රු.180,438,029ක ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස සටහන් කර නොතිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණන අතිරික්තයට එකතුකර මුළු ප්‍රත්‍යාගණන අතිරික්තය රු.4,447,449,850ක් ලෙස දක්වා තිබුණි. | ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය සකස් කිරීමේදී මුළු ප්‍රත්‍යාගණන අගය සැලකිල්ලට ගෙන ඇත. කෙසේවෙතත් පෙන්වා දී ඇති කරුණු අනුව ඉදිරියේදී ශුද්ධ වත්කම් ප්‍රකාශය සකස් කිරීමට කටයුතු කරනු ඇත. | ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 වර්ෂයේදී මණ්ඩලයට ලැබුණු රු.57,865,800ක ප්‍රාග්ධන ප්‍රදාන, අයභාරය ලෙස ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. | 2022 වර්ෂයේදී විලම්භිත ආදායම ලෙස ගිණුම් ගත කර ඇත්තේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් වලින් මිලදී ගත් ස්ථාවර වත්කම් සඳහා වර්ෂයේ කපාහරින ලද ක්ෂය ප්‍රමාණය හා එම ප්‍රදාන තුලින් | ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඍජුවම පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලට වැය කරන ලද වියදමේ එකතුව වේ. ඒ අනුව වර්ෂය තුළ කපා හරින ලද ප්‍රමාණය හැර ඉතිරි මුදල ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ගිණුම් ගත කර ඇත. | |
| (ආ) | ප්‍රධාන කාර්යාලයේ අවසාන භෞතික තොග ශේෂය තුළ ඇතුළත් රථවාහන අමතර කොටස්, නඩත්තු ද්‍රව්‍ය, පවිත්‍රකාරක හා ලිපිද්‍රව්‍ය වැනි චලනය නොවන තොග අයිතම 75ක හා හානි වූ තොග අයිතම 08ක වටිනාකම පිළිවෙලින් රු.373,671ක් හා රු.10,574ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපුම් සිදුකර නොතිබුණි. | ප්‍රධාන ගබඩාවේ භෞතික තොගවල තිබූ චලනය නොවන හා හානි වූ තොග 2022 වර්ෂයේ ඉවත් කිරීමට කටයුතු කර ඇත. එසේ වුවත් නැවත හඳුනාගත් චලනය නොවන හා හානි වූ තොග අයිතම 2023 වර්ෂයේදී අවශ්‍ය පියවර ගෙන ඒ අනුව ගැලපුම් කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලිවල වර්ෂයේ මුළු ප්‍රත්‍යාගණන ලාභය රු.4,276,065,636ක් වුවද එය රු.4,267,011,823ක් ලෙස ගිණුම්ගතකර තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන ලාභය රු.9,053,813කින් අවප්‍රමාණය වී තිබුණි. | ප්‍රත්‍යාගණන ලාභය ගණනය කිරීමේදී වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය ගැලපුම් කර නොමැති බැවින් මෙම වෙනස සිදුවී ඇත. ඉදිරියේදී එම වෙනස සංශෝධනය කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රත්‍යාගණන ලාභය නිවැරදිව ගණනය කළ යුතුය. |
| (ඈ) | වර්ෂය තුළ දී අපහරණයකළ වාහන හා ප්‍රත්‍යාගණනය කළ ඉඩම් හා ගොඩනැගිලි සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය රු.9,591,117ක් ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රත්‍යාගණන අගයන් හා වාහන විකුණුම් අගයන් ගිණුම් ගත කිරීමේදී වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය ගැලපුම් කර නොමැති බැවින් මෙම වෙනස සිදුවී ඇත. ඉදිරියේදී එම වෙනස සංශෝධනය කිරීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව වර්ෂයට අදාල ක්ෂය ගණනය කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 වර්ෂයේදී රබර් පර්යේෂණ මණ්ඩලය විසින් ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය වෙත පවරාදී තිබුණු ඉඩම හා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දරන ලද රු.5,214,500ක වියදම නිරවුල් කර ගැනීමට කටයුතු නොකර වෙනත් ලැබිය යුතු ශේෂ ලෙස ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය වෙත එහි ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් රු.5,214,500ක් අත්තිකාරමක් ලෙස ගෙවා ඇත. ඉන් පසුව 2012 වර්ෂයේදී මෙහි අයිතිය අදාළ ආයතනය වෙත පවරා දී ඇතත් ලබා දී තිබූ අත්තිකාරම නිරවුල් කර නොමැත. මේ පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටුව මගින් වාර්තාවක් කැඳවා ඇති අතර එම වාර්තාව පදනම් කරගෙන ඉදිරියේදී මෙම ශේෂය නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත. | අදාළ ආයතන සමඟ එකඟතාවයකට පැමිණ ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රත්මලාන කාර්යාලය මගින් පරීක්ෂණ වාර්තා නිකුත් කිරීමේ දී හෝ ඊට පෙර ගාස්තු අයකර ගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දින වන විටත් පර්යේෂණ අංශ 03කින්, අවස්ථා 47ක දී නිකුත් කළ පරීක්ෂණ වාර්තා වෙනුවෙන් රු.205,375ක් රජයේ ආයතන, පුද්ගලික ආයතන සහ පුද්ගලයින්ගෙන් අයවිය යුතුව තිබුණි. | මේ පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් 2023.04.24 දින සිට හඳුන්වා දී ඇත. මීට පෙර නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් අනුගමනය නොකරමින් දෙපාර්තමේන්තු මගින් ලබා දී තිබූ ණය ශේෂ මාස තුනක කාලයක් ඇතුළත නිරවුල් කිරීමට උපදෙස් ලබා දී ඇත. | හිඟ පර්යේෂණ ගාස්තු නොපමාව අයකර ගත යුතුය. මෙවැනි හිඟ ඇති නොවීමට විධිවිධාන යෙදිය යුතුය. |
| (ඇ) | "ණයගැතියන් නිරවුල් කිරීම" නමින් වූ ගිණුමක් තුළ පැවති වර්ෂ 10කට වඩා පැරණි ණයගැතියන් 07 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.3,408,310ක් හා බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.1,286,279ක්, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බැඳුම්කර කොන්දේසි කඩ කළ නිලධාරින්ගෙන් ලැබීමට තිබූ ශේෂ අය කර ගැනීමට දීර්ඝ කාලයක සිට කටයුතු කළත් එම මුදල් අය කර ගැනීමට නොහැකි විය. එබැවින් එම ශේෂ අය කර ගැනීමට ඇති අවධානම හා ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව අඩමාණ ණය සියයට 100 වෙන් කිරීමට කටයුතු කර ඇත. | මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. අයකර ගත නොහැකි ශේෂ වෙනුවෙන් අඩමාන ණය ප්‍රතිපාදනය කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xv පරිච්ඡේදයේ 4:7 වගන්තිය | අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු ලබා විදේශගත වී බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන් 05 දෙනෙකුගෙන් වර්ෂ 29 සිට වර්ෂ 32 දක්වා කාලයක් තුළ මණ්ඩලයට අයවිය යුතු එකතුව රු.4,755,341ක් 2023 මැයි 31 දක්වා අයකර ගෙන නොතිබුණි. | නිලධාරීන් දෙදෙනෙකු සඳහා නඩු පැවරීම් කර ඇති අතර අනෙකුත් නිලධාරීන් සමඟ සාකච්ඡා කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන්ගෙන් අදාළ මුදල් අයකර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ. 880 (i) | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව මණ්ඩලය විසින් ඇප තැන්පතු තබාගත යුතු නිලධාරීන්ගෙන් ඇප තබාගෙන නොතිබුණි. | ආයතනයේ ඇප තැබිය යුතු නිලධාරීන්ගේ ඇප මුදල් තබා ගැනීමට මුල සිටම කටයුතු කර නොමැත. ඉදිරි කළමනාකරණ රැස්වීම්වලදී මේ පිළිබඳ සාකච්ඡා කර එම තීරණය ක්‍රියාත්මක කරනු ඇත. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පතු තබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) මු.රෙ. 891 (i) | ඇප තැබිය යුතු නිලධාරීන් සම්බන්ධ විස්තර ඇතුළත් ඇප ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ඇත. | සියලුම විස්තර ඇතුළත් ඇප ලේඛනයක් නඩත්තු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත | | | |
| (i) මු.රෙ.371(2) (ආ) | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි වුවද ඊට පටහැනිව අවස්ථා 03කදී රබර් පර්යේෂණ මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකුට රු.200,000 බැගින් වූ අතුරු අග්‍රිම දෙකක් සහ රු.300,000ක අතුරු අග්‍රිමයක් ලබා දී තිබුණි. | ජාත්‍යන්තර සම්මේලනයක වියදම්, විශේෂ අත්තිකාරම් යටතේ කිරීමට සිදු විය. එහිදී ඇස්තමේන්තු කළ මුදල ලබා දී ඇත. ලබා දුන් මුදලත් සත්‍ය වියදමත් අතර වෙනස නැවත තැන්පත් කර ඇත. මෙවැනි වැඩසටහන් වලදී වැය වන මුදල් නිවැරදිව තක්සේරු කල නොහැකි බැවින් මෙවැනි විෂමතාවයන් ඇති වී ඇත. | අදාළ මුදල් රෙගුලාසිවලට අනුකූලව අතුරු අග්‍රිම ලබාදිය යුතුය. |
| (ii) මු.රෙ.371(4) | ගණන් දීමේ නිලධාරියා විසින් වුවද නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොගත යුතු වුවද, නිශ්චිතව අවශ්‍යතාවය හඳුනාගෙන නොතිබීම හේතුවෙන් අවස්ථා 12ක දී ලබා දී තිබුණු රු.127,500ක තත්කාර්ය අතුරු අග්‍රිම වියදම් කිරීමකින් තොරව නැවත බාර දී තිබුණු අතර, අවස්ථා 18ක දී ලබා දුන් අත්තිකාරම්වලින් සියයට 45 සිට සියයට 83ක් දක්වා ආපසු මුදලින් පියවා තිබුණි. මුදල් ආපසු බාර දීමට මාස 04ක කාලයක් ගත වූ අවස්ථාවක්ද නිරීක්ෂණය විය. | අත්තිකාරම් ලබා ගැනීම හා නිරවුල් කිරීම පිළිබඳ උපදෙස් සියලු අංශ /දෙපාර්තමේන්තු වෙත මෙමෝපතක් මගින් දැනුවත් කිරීමට කටයුතු කර ඇතත් එයට අනුකූල නොවන අයුරින් කටයුතු කර ඇත. එබැවින් මේ පිළිබඳ අදාළ නිලධාරින්ගෙන් කරුණු විමසීමට කටයුතු කර ඇත. | අදාළ මුදල් රෙගුලාසිවලට අනුකූලව අතුරු අග්‍රිම නිකුත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) මු.රෙ.371(5) | අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යයන් නිම කර දින 10ක් ඇතුළත පියවිය යුතු වුවද, ආයතනය විසින් 2022 වර්ෂයේදී ලබා දී තිබුණු එකතුව රු.426,609ක් වූ තත්කාර්යය අතුරු අග්‍රිම 28ක් පියවීම සඳහා දින 14ත්, දින 49ත් අතර කාලයක් ප්‍රමාද කර තිබුණි. | සුළු මුදල් අත්තිකාරම් ලබා දීම පිළිබඳ අභ්‍යන්තර උපදෙස් නිකුත් කර ඇති නමුත් ඊට පටහැනිව ක්‍රියාත්මක වී ඇති අවස්ථා පෙන්වා දී ඇත. මේ පිළිබඳ අදාළ නිලධාරීන් මගින් කරුණු විමසා ඇති අතර එම තොරතුරු අනුව ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ඇත. | අදාළ මුදල් රෙගුලාසිවලට අනුකූලව අතුරු අග්‍රිම නිකුත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,367,158ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,873,555ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,506,397ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට භාණ්ඩාගාර ප්‍රදාන රු.28,840,000කින් අඩු වීම, වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ සහ නඩත්තු වියදම් පිළිවෙලින් රු.16,969,417කින් හා රු.8,162,135කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| අයිතමය | සමාලෝචිත වර්ෂය<br>රු. | ඉකුත් වර්ෂය<br>රු. | වැඩි වීම/ (අඩු වීම)<br>රු. | ප්‍රතිශතය<br>සියයට |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රදාන | 394,650,000 | 423,490,000 | (28,840,000) | (7) |
| වෙනත් ආදායම් | 21,242,083 | 10,657,312 | 10,584,771 | 99 |
| විලම්භිත ආදායම් | 174,271,891 | 139,733,221 | 34,538,670 | 25 |
| වතු ආදායම් | 133,143,628 | 118,624,133 | 14,519,495 | 12 |
| සැපයුම් හා පරිභෝජන වියදම් | 29,029,011 | 24,033,699 | 4,995,312 | 21 |
| නඩත්තු වියදම් | 57,795,485 | 49,633,350 | 8,162,135 | 16 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාත පිළිවෙලින් 5.4:1ක් හා 4.9:1ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එම අනුපාතයන් පිළිවෙලින් 5.3:1ක් හා 4.9:1ක් විය. රු.74,920,070ක් මුදල් හා මුදල් සමාන දෑ ලෙස පවත්වාගෙන යාමත් සැපයුම්කරුවන්ට අත්තිකාරම් ලෙස වර්ෂය අවසානයේ දී රු.34,618,244ක් ලබා දී තිබීමත් මෙම ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන් ඉහළ අගයක් ගැනීමට හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රබර් පර්යේෂණ මණ්ඩලය විසින් මොණරාගල කුමාරවත්ත හා අලව්ව නාරම්පොලවත්ත යන උප මධ්‍යස්ථාන 02හි 2022 දෙසැම්බර් 31 දින වන විට රු.16,213,367ක් වැයකර කාර්යාල ගොඩනැගිලි ඉදිකර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණ ද එම ඉඩම් නීත්‍යානුකූලව ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් පවරා ගෙන නොතිබුණි. | මොණරාගල කුමාරවත්තේ ඉඩමේ අයිතිය අප ආයතනයට පවරා ගැනීම සම්බන්ධයෙන් සම්පූර්ණ කළ යුතු කාර්යයන් ඉටු කර ගැනීමට මොණරාගල ප්‍රදේශීය ලේකම් හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස දන්වා ඇත.<br>පොල්ගහවෙල නාරම්පොලවත්ත ඉඩමේ අයිතිය පවරා ගැනීම සහ ඉඩම් අත්කර ගැනීම සම්බන්ධයෙන් අදාළ මැනුම් ගාස්තු ගෙවීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීමට උපදෙස් ලබා දී ඇත. | ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) | මණ්ඩලය විසින් ටයර් පරීක්ෂා කිරීමේ ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විට ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මාර්තු හා මැයි මාසයන් හි එම කාර්යය සඳහා රු.29,907,471ක යන්ත්‍රෝපකරණ 03ක් මිලදී ගෙන තිබුණි. එහෙත් අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීමට අපොහොසත් වීම නිසා මෙම උපකරණ විගණිත දින වූ 2022 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම උපකරණ දැනට ස්ථාපනය කර ඇති අතර පර්යේෂණ කටයුතු ඉදිරියේදී ආරම්භ කරනු ඇත. | වත්කම් නොපමාව උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | "ටයර් පරීක්ෂා කිරීමේ ගොඩනැගිල්ල" ඉදිකිරීමට අදාළව සමාලෝචිත වර්ෂය තුළදී රු.196,300කට මිලදී ගත් කොන්ක්‍රීට් වළලු භාවිතයට නොගෙන ඉදිකිරීම් භූමියේ ගොඩගසා තිබුණි. | මෙම කොන්ක්‍රීට් වළලු ඉදිකිරීම් කටයුතු නවතා ඇති බැවින් නැවත භාවිතයට ගන්නා තෙක් එම භූමියේ තැන්පත් කර ඇත. ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ විට මෙම වළලු භාවිතා කරනු ඇත. | නොපමාව ටයර් පරීක්ෂා කිරීමේ ඒකකය ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්වය යටතේ ව්‍යාපාරික ආකෘතියක් ලෙස රබර් නිෂ්පාදන සැලසුම් කිරීම සහ කාර්යසාධනය ඇගයීම සඳහා 2019 වර්ෂයේ දී රු.මිලියන 49.7ක් වැයකර "අංශුමාත්‍ර පරිමිත සේවාකරණ මධ්‍යස්ථානය"ක් පිහිටුවා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, එම මධ්‍යස්ථානය පිහිටුවීමෙන් අපේක්ෂිත ටයර් ආකෘති නිෂ්පාදන අරමුණ ඉටු වී නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය. | මෙයට අදාළ ගිවිසුම් කොන්දේසි සංශෝධනය කර නැවත අත්සන් කිරීම සඳහා කටයුතු කරගෙන යනු ඇත. | මධ්‍යස්ථානයේ අපේක්ෂිත නිෂ්පාදනය නොපමාව ඇරඹිය යුතුය. |
| (ඉ) | මණ්ඩලය විසින් 2019 හා 2020 යන වර්ෂවලදී ආරම්භ කර එම වර්ෂ 02ක තුළදීම අවසන් කිරීමට නියමිතව තිබුණු රු.6,334,344ක මුළු කොන්ත්‍රාත් වටිනාකමක් සහිත අගලවත්ත කර්මාන්තශාලාව සඳහා විද්‍යුත් සවිකිරීම් හා රත්මලාන ජෛව රසායන හා කායික විද්‍යා දෙපාර්තමේන්තුවේ අලුත්වැඩියාවන් ලෙස කොන්ත්‍රාත් දෙකක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කිරීමට නොහැකි වී තිබුණු අතර මේ සඳහා රු.5,028,253ක් ගෙවීම් කර තිබුණි. | 2019 සහ 2020 යන වර්ෂවලදී ආරම්භ කළ මෙම ඉදිකිරීම්වල කටයුතු මේවන විට අවසන් කර ඇති අතර එහි අවසන් කිරීමේ සහතිකය ලැබූ පසු 2023 වර්ෂයේ ගිණුම් වලින් නිවැරදි කරනු ඇත. | මෙවැනි ප්‍රමාද වීම් සිදු නොවීමට වග බලා ගත යුතුය. |
| (ඊ) | මණ්ඩලයේ පවතින විදුලි රැහැන් පද්ධතිය නවීකරණය කිරීම සඳහා 2017 වර්ෂයේ දී රු.143,934ක් වැය කර විදුලි කණු 10ක් මිලදී ගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම කණු භාවිතා කර සැලසුම් කළ කාර්යය නිමකර නොතිබුණි. | මෙම විදුලි රැහැන් කණු සිටුවා ඇති අතර මුදල් ප්‍රතිපාදන ලැබීමෙන් පසු රැහැන් ඇදීමට පියවර ගනු ඇත. | නොපමාව විදුලි රැහැන් පද්ධතිය නවීකරණය කළ යුතුය. |
| (උ) | 2019 වර්ෂයේදී ගිණුම් අංශයේ ලේඛනාගාරය නවීකරණය සඳහා රු.83,536ක් වැය කර Dura Panel Board 20ක් මිලදී ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට අදාළ අරමුණෙන් බැහැරව එයින් බෝඩ් 10ක් භාවිතා කර තිබුණු අතර, බෝඩ් 10ක් තවදුරටත් නිෂ්කාර්යව පැවතුණි. | ඉතිරිව ඇති Dura Panel Board ඉදිරියේදී ආයතනයේ අලුත්වැඩියා කටයුතු සඳහා භාවිතා කරනු ඇත. | ගිණුම් අංශයේ ලේඛනාගාරය සැලසුම් කළ පරිදි නවීකරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | මොණරාගල උප මධ්‍යස්ථානයේ දුම් ගෙයක් ඉදිකිරීම සඳහා 2022 ජනවාරි මාසයේ දී ලැබී තිබුණු රු.500,000ක ප්‍රදානයෙන් 2022 ජූලි, ඔක්තෝබර්, දෙසැම්බර් මාසවලදී අමුද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රු.448,450ක වියදමක් දරා තිබුණ ද, මෙම ඉදිකිරීම් විගණිත දින වූ 2023 අප්‍රේල් 27 දින වන විටත් නිම කිරීමට කටයුතු කර නොතිබුණි. | දුම් ගෙවල් ඉදි කිරීම සඳහා තුරුසවිය අරමුදල මගින් ලබා දී තිබූ රු.500,000ක මුදල භාවිතා කොට රු.448,450ක වැඩ නිම කර ඇතත් ලබා දී තිබූ මුදල් ප්‍රමාණවත් නොවීය. එබැවින් ඉදිරියේදි ආයතනික අරමුදල් භාවිතා කොට සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත. | සැලසුම් කළ පරිදි ඉදිකිරීම් කටයුතු අවසන් කර එම වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 ක්‍රියාකාරි සැලැස්ම අනුව ශාක විද්‍යා අංශය මගින් රබර් වගාව යටතේ අතුරු බෝග වගාව ඇගයීමට අදාළව අතුරු බෝග වගා ආකෘති (intercropping models) 02 ක් පරීක්ෂා කිරීමට ඉලක්ක කර තිබුණද එම කාර්යය ඉටු කර නොතිබුණි. | මෙම පර්යේෂණ කටයුතු මොණරාගල සහ අම්පාර යන ප්‍රදේශවල සිදු කිරීමට සැලසුම් කර තිබුණද ඉන්ධන ගැටලුව හේතුවෙන් ප්‍රවාහන පහසුකම් සපයා ගැනීම අපහසු විය. මේ වන විට අදාළ දත්ත රැස් කර විශ්ලේෂණය සිදු කරමින් පවතී. එමඟින් සාර්ථක ප්‍රතිඵල පිළිබිඹු වන බැවින් අතරමැදි කලාපයේ රබර් සමඟ පළතුරු බෝග වගා පද්ධතින් 02ක් සහ ක්ෂේත්‍ර බෝග වගා පද්ධතියක් නිර්දේශයන් සඳහා ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. | සැලසුම් කරන ලද ඉලක්කයන් අදාළ කාලය තුළදී සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 ක්‍රියාකාරි සැලැස්ම අනුව ශාක විද්‍යා අංශය මගින් රබර් කිරි කැපීමේ දියුණු තාක්ෂණික ක්‍රමවේදයක් හඳුන්වා දීමට ඉලක්ක කර ඒ වෙනුවෙන් රු.500,000 ක් වෙන් කර තිබුණු අතර වර්ෂය අවසානයේ ඒ සඳහා දත්ත එක්රැස් කිරීම පමණක් සිදුකර තිබුණි. | මෙම අරමුදල් භාවිතා කොට රබර් කිරි කැපීමේ තාක්ෂණ ක්‍රමවේද කිහිපයක් අත්හදා බලන ලදී. රබර් කිරි කැපීම සඳහා ආනයනය කරන ලද කිරි කැපීමේ මැෂිමක්ද පරීක්ෂා කරන ලදී. පසුගිය වසර අවසානයේ පැවති අයහපත් කාළගුණය සහ මැෂිමේ අත්‍යවශ්‍ය නඩත්තු කටයුත්තක් සිදු වූ බැවින් රැස් කරන ලද දත්ත ප්‍රමාණවත් නොවීය. මෙම මැෂිම සතුටුදායක ප්‍රතිඵල පෙන්වා ඇති බැවින් ආයතනයේ පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. | සැලසුම් කරන ලද ඉලක්කයන් අදාළ කාලය තුළදී සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 ක්‍රියාකාරී සැලැස්ම අනුව ශාක විද්‍යා අංශයේ ප්‍රගතිය විගණනයට ඉදිරිපත් කිරීමේදී කාර්යයන් 08කට අදාළව දරන ලද වියදමේ එකතුවක් පමණක් ඉදිරිපත් කර තිබුණු බැවින් එක් එක් කාර්යයන් සඳහා දරන ලද වියදම වෙන් වෙන්ව හඳුනා ගත නොහැකි විය. | පර්යේෂණ අංශයක් ලෙස සෑම විටම පර්යේෂණ දත්ත සහ මූල්‍ය තොරතුරු කාර්යයන් සඳහා වෙන වෙනම සටහන් කර ගනු ලැබේ. නමුත් 2021 වසර අවසානයේ සිට මේ දක්වා සේවක සංඛ්‍යාව අඩු වී ඇත. කෙසේ වුවද මෙම කටයුතු 2023 වසරේදී මගහරවා ගැනීමට පියවර ගනු ඇත. | එක් එක් කාර්යයන් සඳහා සිදු කරන ලද වියදම් වෙන වෙනම හඳුනාගත හැකි වන පරිදි තහවුරු කිරීමේ ලිපි ලේඛන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | 2022 ක්‍රියාකාරී සැලැස්ම අනුව රබර් තාක්ෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධයෙන් ව්‍යවසායකයින් 150ක් සඳහා තාක්ෂණික සහාය ලබා දීමට ඉලක්ක කර තිබුණද ව්‍යවසායකයින් 60ක් සඳහා පමණක් පුහුණුව ලබාදී තිබුණි. එය ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 40කි. | 2022 වසරේදී ව්‍යවසායකයන් 60දෙනෙකු විසින් කරන ලද ඉල්ලීම මත ඔවුන්ට රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය සඳහා පුහුණුව ද, කර්මාන්තකරුවන් 16 දෙනෙකුගේ ඉල්ලීම මත රබර් සංයෝග/ භාණ්ඩ නිෂ්පාදනයේදී පැන නැගුණු ගැටලු නිරාකරණය කිරීම හා කර්මාන්තකරුවන්/ වැවිලි සමාගම් 20කගේ ඉල්ලීම මත දළ රබර්/රබර් සංයෝග/රබර් භාණ්ඩ සඳහා පරීක්ෂණ සිදු කර තත්ත්ව සහතික නිකුත් කිරීමද සිදු කරන ලදී. එය ප්‍රතිශතයක් ලෙස සියයට 64ක් වන අතර ව්‍යවසායකයින් 60 දෙනාගෙන් කිහිප දෙනෙකු මේ වනවිට දේශීය වෙළඳපළ සඳහා රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය සිදු කරනු ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් කරන ලද කාර්යයන් අදාළ කාලය තුළදී නිම කළ යුතුය. |
| (ඉ) | 2022 ක්‍රියාකාරී සැලැස්ම අනුව ජීවමිතික අංශය මගින් යෝග්‍ය සංඛ්‍යාන ක්‍රම මගින් පර්යේෂණ ව්‍යාපෘතිවල විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම හා රබර් වගා කරන ප්‍රදේශවල වඩා හොඳ තීරණ සඳහා දේශගුණ විපර්යාස සහ විචල්‍යතාව පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සඳහා රු.360,000ක් වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය රු.190,000ක් එනම් වෙන් කළ මුදලින් සියයට 52කි. | ජීවමිතික අංශය සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද, ඇතැම් ප්‍රතිපාදන දත්ත එකතු කිරීම සඳහා යොදා ගැනිමට සැලසුම් කර තිබූ නමුත් එම දත්ත රැස් කිරීම සඳහා විශාල වශයෙන් රබර් වගා කරනු ලබන ප්‍රදේශ වල ගමන් කළ යුතුව තිබුණි. නමුත් රට තුළ පැවති ඉන්ධන අර්බුදය හමුවේ එම ක්‍රියාකාරකම් සඳහා දත්ත එක්රැස් කිරීමට නොහැකි විය. තවද විදේශ මුදල් අර්බුදය පැවති බැවින් අප විසින් භාවිතා කරන ලද මෘදුකාංග යාවත්කාලින කිරීමට නොහැකි විය. එබැවින් වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් එම ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම සීමා විය. | සැලසුම් කරන ලද ඉලක්කයන් අදාළ කාලය තුළදී සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනන අංශය මගින් රටවල් 2ක් සමග බහුපාර්ශවික ක්ලෝන හුවමාරු කිරීමට සැලසුම් කර තිබුණද එම කාර්යය ඉටු කර නොතිබුණි. | මේ සඳහා රටවල් 4ක් සමග සාකච්ඡා කළද 2022 වර්ෂයේ එම රටවල පැවති තත්වය මත එම ක්ලෝන හුවමාරු කිරීමට සුදුසු තත්වයක් නොතිබුණි. | සැලසුම් කරන ලද ඉලක්කයන් අදාළ කාලය තුළදී සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනන අංශය මගින් නව ප්‍රවේණි 150ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද ප්‍රවේණි වර්ග 68ක් පමණක් නිපදවා තිබුණි. | අයහපත් කාලගුණික තත්ත්ව හා නව පත්‍ර පතන රෝගය නිසා බොහෝ පරාගනය කරන ලද මල් වැටීම සිදු වූ අතර කෘතිම පරාගන 1398ක් සිදු කළ නමුත් ඉන් සාර්ථක වූයේ 68ක් පමණි. මෙම තත්වය වළක්වා ගැනීමට අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග අනුගමනය කළද ඇතිවූ අයහපත් පාරිසරික තත්වය නිසා අඛණ්ඩව මෙම ගැටලුකාරී තත්වයන්ට මුහුණ දී ඇත. | සැලසුම් කරන ලද ඉලක්කයන් අදාළ කාලය තුළදී සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව ශාක ව්‍යාධි විද්‍යා හා ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශය මගින් භෞතික ඉලක්ක දක්වා තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දිනට ළඟා කර ගත් ඉලක්ක විගණනයට ඉදිරිපත් කළ ප්‍රගති වාර්තාව තුළ ඇතුළත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | සැලසුම් කරන ලද ඉලක්කයන් අදාළ කාලය තුළදී සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතු අතර සියලු තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඒ) | 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව ශාක ව්‍යාධි විද්‍යා හා ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශය මගින් 2022 වර්ෂය අවසාන වන විට අවසන් කිරීමට ඉලක්ක කර තිබුණු රබර් වගාවේ සුදු මුල් රෝගයට එරෙහිව සටන් කිරීමට උපායමාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය හා අඩු තීව්‍රතා අස්වනු නෙලීමේ පද්ධති (LIH) හඳුන්වා දීමේ ව්‍යාපෘතිය සඳහා පිළිවෙළින් රු.මිලියන 18.52ක් හා රු.මිලියන 6.69ක් වෙන් කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එම ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාලව 2021 වර්ෂය දක්වා සියලුම ඉලක්ක සපුරා ඇත. නමුත් 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියට අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් මෙහි කාර්යයක් වූ දැනුම බෙදාහැරීමේ කාර්යය කිරීමට නොහැකි වී ඇත. | සැලසුම් කරන ලද ඉලක්කයන් අදාළ කාලය තුළදී සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතු අතර සියලු තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ ප්‍රධානම තනතුරක් වන අධ්‍යක්ෂ තනතුර සඳහා 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වර්ෂ 04කට වැඩි කාලයක් සඳහා නිත්‍ය නිලධාරියෙකු පත්කර නොතිබුණු අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (තාක්ෂණ) විසින් එම තනතුරෙහි වැඩබැලීම සිදුකරමින් පවතී. | අධ්‍යක්ෂ තනතුරේ පුරප්පාඩුව පිරවීම සඳහා අනුමැතිය ලබාගැනිමෙන් පසු බඳවා ගැනීම් සිදු කරනු ඇත. | මණ්ඩලයේ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් කඩිනම් කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ(පාලන) තනතුර පුරප්පාඩුව පැවති අතර වර්ෂ 04කට වැඩි කාලයක් ගතවූවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම පත්වීම ලබා දීමට කටයුතු කර නොතිබුණි. | මෙම පුරප්පාඩුව පිරවීම සඳහා අනුමැතිය ලැබී නොමැත. | මණ්ඩලයේ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් කඩිනම් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ පර්යේෂණ අංශය සඳහා පර්යේෂණ අංශ ප්‍රධානීන්, ප්‍රධාන පර්යේෂණ නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් සහ පර්යේෂණ නිලධාරීන් 69 දෙනෙකු අනුමත වී තිබුණු නමුත් පර්යේෂණ අංශ ප්‍රධානීන් 5ක්, ප්‍රධාන පර්යේෂණ නිලධාරීන් 12ක්, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් 13ක් සහ පර්යේෂණ නිලධාරීන් 14ක් වශයෙන් පර්යේෂණ අංශ නිලධාරීන් 44 දෙනෙකුගේ ඌනතාවයක් පැවති අතර එය අනුමත නිලධාරී සංඛ්‍යාවෙන් සියයට 63ක් විය. | මෙම නිලධාරීන්ගෙන් පර්යේෂණ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ප්‍රධාන පර්යේෂණ නිලධාරීන්/ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන්ගේ පස් දෙනෙකු (05) ගේ පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලැබී ඇත. | අනුමැතිය ලැබී ඇති නිලධාරීන් බඳවා ගැනීම කඩිනම් කළ යුතුය. අනෙකුත් පුරප්පාඩු පිරවීමට හෝ අවශ්‍යතාවය නැවත සලකා බලා අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය. |